ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

## පුවත්පත් නිවේදනය

**ඉන්දියා - ශ්‍රී ලංකා විදුලිබල ජාල අන්තර් සම්බන්ධතාවය පිළිබඳ අතථ්‍ය හමුව**

ඉන්දියා - ශ්‍රී ලංකා විදුලිබල ජාල අන්තර් සම්බන්ධතාවයට අදාළ කරුණු කාරණා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන සාකච්ඡාවක් 2025 ඔක්තෝබර් 30 වන දින අතථ්‍ය ආකාරයෙන් පැවැත්විණ. ඉන්දීය දූත පිරිසේ ප්‍රධානත්වය ඉන්දීය රජයේ විදුලිබල අමාත්‍යාංශයේ ලේකම් ශ්‍රී පංකජ් අගර්වාල් මහතා විසින් ද ශ්‍රී ලංකා දූත පිරිසේ ප්‍රධානත්වය ශ්‍රී ලංකා රජයේ බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් මහාචාර්ය කේ. ටී. එම්. උදයංග මහතා විසින් ද දරන ලදී.

2. විදුලිබල ජාල ව්‍යාපෘතියට අදාළ කරුණු කාරණා ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විවිධ පැතිකඩ දෙපාර්ශ්වය විසින් සාකච්ඡා කරන ලදී. 2025 ජූනි 16 වන දින දිල්ලියේ පැවති හමුවක් අතරතුර දී දෙපාර්ශ්වය විසින් ඉන්දියා - ශ්‍රී ලංකා විදුලබල ජාල අන්තර් සම්බන්ධතාවයේ තාක්ෂණික පරාමිතීන් තහවුරු කරන ලදී.

3. සම්ප්‍රේෂණ මාර්ගය හරහා ශ්‍රී ලංකාවට විදුලිය හිඟ අවස්ථාවලදී විදුලිය ආනයනය කිරීමටත් පුනර්ජනනීය විදුලිය අපනයනය කර විදේශ විනිමය ඉපැයීමටත් හැකි වනු ඇත. එසේම, එතුළින් අපනයන සහ බලශක්ති මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමට, විදුලිබල ජාල ස්ථායිතාවය වැඩි දියුණු කිරීමට සහ කලාපීය විදුලිබල වෙළෙඳපොළ හා ඒකාබද්ධ වීමට නව අවස්ථා ද උදා වනු ඇත. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දෙපාර්ශ්වය ඉදිරියේදී වැඩිදුර සාකච්ඡාවන්හි නිරත වනු ඇත.

****

**කොළඹ**
***2025 ඔක්තෝබර් 31***